මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/GPS/13/03/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.09.13

**ජාතික අයවැය චක්‍රලේඛ : 03/2025**

සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවන් හා ක්ෂේත්‍ර කටයුතු සඳහා වාහන සහ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම සඳහා තොරතුරු කැඳවීම**

රජයේ සංවර්ධන වැඩපිළිවෙල කඩිනම්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, වනජීවී, වන සංරක්ෂණ, ප්‍රාදේශීය පරිපාලනය යනාදී ක්ෂේත්‍රවල සංවර්ධන කටයුතු හා පවතින ගැටළු කඩිනමින් අවසන් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා දැනට පවතින වාහන සහ යන්ත්‍රෝපකරණ ප්‍රමාණවත් නොවීමත්, පවතින වාහන සහ යන්ත්‍රෝපකරණ බොහෝමයක් පැරණි ඒවා වීම හේතුවෙන් ඒවා අළුත්වැඩියා කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීමත්, වැනි හේතු මත සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් වී තිබේ. රාජ්‍ය ආයතන සඳහා අත්‍යවශ්‍ය වාහන සහ යන්ත්‍රෝපකරණ ප්‍රමාණයක් කඩිනමින් මිල දී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2025 වර්ෂයේදී එම වාහන අවශ්‍යතාවයෙන් ඩබල් කැබ් රථ ප්‍රමාණයක් ප්‍රථමයෙන් මිළදී ගැනීමට රජය තීරණය කර ඇත.

02. ඒ අනුව, ක්ෂේත්‍ර රාජකාරී කටයුතු පැවරී ඇති ඔබ අමාත්‍යාංශය/පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතනවල ඩබල් කැබ් රථ අවශ්‍යතාව ඇමුණුම 1 හි විධිවිධාන අනුව 2025.09.30 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත යොමු කළ යුතු වේ.

අචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාර ලේකම්

**ඇමුණුම 01**

## වාහන අවශ්‍යතා තක්සේරු කිරීම

(අ) වාහන මිලදී ගැනීම සඳහා වන සියළුම ඉල්ලීම් නිසි පරිදි සම්පූර්ණ කරන ලද, මෙම චක්‍රලේඛයේ ඇමුණුම ii හි දක්වා ඇති ආකෘති පත්‍රය මඟින් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා හරහා මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පෙර එම ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතීත්වය දරණ කමිටුවක් මඟින් පහත නිර්ණායකයන් අනුව සමාලෝචනය කළ යුතුය.

(i) වාහනය/වාහන අවශ්‍යතාවය සඳහා වන හේතු

(ii) ආයතනයේ වාහන අවශ්‍යතාවය හා දැනට පවතින වාහන සංචිතය

(iii) දැනට පවතින ප්‍රතිස්ථාපනය කිරීමට නියමිත වාහනයේ/ වාහනවල ආයුකාලය සහ තත්ත්වය

(iv) පවතින වාහනය/වාහන සඳහා පසුගිය වර්ෂ 3ක නඩත්තු පිරිවැය

(v) නිල වාහන ලෙස නිලධාරීන්ට අනුයුක්ත කිරීම සඳහා මෙම මිළදී ගැනීමට යෝජිත කැබ් රථ යොදා නොගත යුතු අතර ඉන්ධන දීමනාවද, එම වාහන පදනම් කරගෙන නොගෙවිය යුතුය.

(vi) භාණ්ඩාගාර ලේකම්ගේ 2020.10.02 දිනැති අංක 05/2020 සහ 2022.01.25 දිනැති අංක 04/2022 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛණ අනුව අපහරණය කරන ලද වාහන සංඛ්‍යාව

(vii) මෙම චක්‍රලේඛයේ පවතින ප්‍රතිපාදන සහ මෙම සමාලෝචනය සඳහා යෝග්‍ය වන වෙනත් කරුණු,

(ආ) රජයේ වාහන ඵලදායී අයුරින් භාවිතා කිරීම සහතික කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම්, රාජ්‍ය ආයතනයට අදාළ වන පහත කරුණු සලකා බලමින්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් විධිමත් අධ්‍යයනයක් කරනු ඇත.

(i) සමාලෝචන කමිටුවේ නිර්දේශය

(ii) ආයතනික විධිවිධාන

(iii) සංචිතයේ පවත්නා වාහන උපරිම ආර්ථික ඵලදායීතාවයක් ලැබෙන ලෙස භාවිතා කිරීම

(iv) රාජ්‍ය ආයතනයේ පවතින වාහන සංචිතය තුළ අවශ්‍යතාවය කළමනාකරණය කරගැනීමේ හැකියාව

(ඇ) ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් ඔහුගේ/ඇයගේ නිර්දේශ සහිතව එම අයදුම්පත ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත.

*Annex II*

**Approval of the Department of National Budget for Procurement of Vehicles.**

1. Name of the Ministry / Department / Pubic Institute ..............................................................................

2. Type of Vehicle/s requested – **Double Cabs**

| Number of Double Cabs | Purpose of purchasing | In case of replacement, details of the dispose vehicle | |
|---|---|---|---|
| | | Year of manufacture | Registration number |
| | | | |

3. Reason/s for the requirement of vehicle/s ..............................................................................................

4. Details of existing vehicles in the Ministry/Department/Public Institution

| Vehicle Type | Number of Vehicles | | | |
|---|---|---|---|---|
| | Age less than 05 years | Age 05-10 years | Age more than 10 years | Availability of Rented/hired Vehicles |
| Sports Utility Vehicle (SUV) | | | | |
| Motor Car | | | | |
| Double Cab | | | | |
| Van | | | | |
| Other (Pl. specify) | | | | |

5. Contact information and recommendation

5.1 Contact Officer's name and telephone no. ....................................................

5.2 Recommendation ..............................................................................................................................

..................................................................

Head of the Department/Institution

Date ...............................................

6.1 Having review at the committee, the following vehicles are recommended.

| Number of Double Cabs | Purpose of purchasing |
|---|---|
| | |

In case of replacement, Register numbers of the Dispose Vehicles to be mentioned ........................

.......................................................................................

Secretary to the Ministry/Chief Secretary

Date ..................................................

6.2 Recommendation of the Comptroller General

Director General,

Department of National Budget

The following vehicles are recommended

| Number of Double Cabs Requested | No of Double Cabs Recommended |
|---|---|
| | |

.......................................................................................

Comptroller General

Office of Comptroller General

Date ..................................................